පිටුව 06.

2022.02.23

# ජනවාරි උද්ධමනය ඉහළටම යයි

## 2021 ජනවාරි මාසයේ පැවතියේ 3.7%ක උද්ධමනයක් පමණි

## මේ වසරේ 16.8%ක් ලෙස ඉහළට




● මලිල පෙරේරා

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2021 දෙසැම්බර් මාසයේ පැවැති 14% සිට 2022 ජනවාරි මාසයේදී 16.8%ක් දක්වා වාර්තාගත ලෙස ඉහළ ගොස් තිබේ.

ඒ අනුව, 2022 ජනවාරි මාසය අවසානයේදී නිකුත් කරනු ලැබූ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමන අගය වූ 14.2%ක අගයද, එම මාසය සඳහාම වූ ජාතික පාරිභෝගික මිල දර්ශකයේදී මෙලෙස සැලකිය යුතු ලෙස ඉක්මවා ගොස් ඇත.

2022 ජනවාරි මාසයේ මතුපිට උද්ධමනය (16.8%) සඳහා ආහාර කාණ්ඩයේ 11.4%ක හා ආහාර නොවන කාණ්ඩයේ 5.4%ක දායකත්වයක් පිළිවෙළින් ලබා දී තිබේ. එහෙත් පසුගිය වසරේ (2021) ජනවාරි මාසයේ 3.7%ක් වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 2.7%ක් සහ ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.0%ක් ලෙස සටහන් විය.

2021 ජනවාරි මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල පැවැති ඉහළ මිල මට්ටම් හේතු වී තිබේ. ඒ අනුව ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය (ලක්ෂ්‍යමය) 2021 දෙසැම්බර් මාසයේ පැවැති 21.5% සිට 2022 ජනවාරි මාසයේදී 24.4%ක් දක්වා වැඩි වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය (ලක්ෂ්‍යමය) 2021 දෙසැම්බර් මාසයේ පැවැති 7.6% සිට 2022 ජනවාරි මාසයේදී 10.2%ක් දක්වා වැඩි වී ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

පෙර මාසය සමග සැසඳීමේදී 2022 ජනවාරි මාසයේ ආහාර කාණ්ඩයේ සහල්, කිරිපිටි, පලතුරු, අලුත් මාළු, කිරිගු පිටි, පාන්, එළවළු, පොල්තෙල්, කුකුළු මස්, මිරිස් කුඩු, වියළි මිරිස්, අමු මිරිස්, මයිසූර් පරිප්පු, ළදරු කිරිපිටි, පොල්, කරවල, අර්තාපල්, රටලූනු සහ ලොකුලූනු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වුවත් දෙහි සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී තිබේ. එමෙන්ම ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්), 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (ගොඩනැගිලි ද්‍රව්‍ය), 'ගෘහ උපකරණ හා ගෘහ නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය ගාස්තු), 'ප්‍රවාහන' (පෙට්‍රල්, ඩීසල් හා බස් ගාස්තු), 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' (උපකාරක පන්ති ගාස්තු), 'ආපන ශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතම්වල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සැසඳීමේදී 'සන්නිවේදන' කාණ්ඩයේ මිල දර්ශක අගය වෙනසක් වී නොමැති බවද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැඩිදුරටත් පවසයි.